**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
தேசிய மதிப்பீட்டுக்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்லை
Pelawatta, Battaramulla.

දුරකථන / தொலைபேசி / Telephones } 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206,
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503, කොළඹ / த.பெ. 1503, கொழும்பு / P.O.Box 1503 Colombo

අන්තර්ජාල ලිපිනය / இணையத்தள முகவரி / Internet Address } www.doenets.lk
E-mail : examd@sltnet.lk


මගේ අංකය / எனது இல / My No } 6/5/ශිෂ්‍යත්ව/ප්‍රතිඵල/2026

ඔබේ අංකය / உமது இல / Your No } ........................

දිනය / திகதி / Date } 2026.09. 02

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

**<u>පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණිය සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2026 ප්‍රතිඵල නිකුත් කිරීම</u>**

උක්ත විභාගයේ ප්‍රතිඵල නිකුත් කර ඇති බව මෙයින් දන්වන අතර විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.doenets.lk හි Our Services යටතේ ඇති Exam Information Center වෙත පිවිස ඔබ වෙත ලබා දී ඇති පරිශීලක නාමය හා මුරපදය භාවිත කර ඔබගේ පාසලේ ප්‍රතිඵල ලේඛනය මාර්ගගතව බාගත කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇත. එම ප්‍රතිඵල ලේඛනයෙහි මුද්‍රිත පිටපතක් පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර අදාළ අයදුම්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතු ය. ප්‍රතිඵල ලේඛනයේ මුද්‍රිත පිටපත් සහ අපේක්ෂකයන්ගේ කේවල සහතික අභියාචනා සලකා බැලීමෙන් පසු ඔබ වෙත තැපැල් මගින් එවීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.

02. පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්කවලට අදාළ අවම කඩඉම් ලකුණු සීමාවන් මේ සමග ඉදිරිපත් කරමි. එම කඩයිම් ලකුණු සීමාවෙන් ඉහළ ලකුණු ලබා ඇති අයදුම්කරුවන්ගේ නම් ඉදිරියෙන් **"QUALIFIED"** යනුවෙන් ද, කඩයිම් ලකුණු සීමාවෙන් පහළ ලකුණු ලබා ඇති අයදුම්කරුවන්ගේ නම් ඉදිරියෙන් **කඩඉරි තුනක්** ද සඳහන් වේ.

03. **"QUALIFIED"** යනුවෙන් සඳහන් අයදුම්කරුවන් අතුරින් ආදායම් තීරුවේ **"BELOW"** යනුවෙන් සහ ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම් ඇති වයස් සීමාවේ සිටින අයදුම්කරුවන් පමණක් ශිෂ්‍යාධාර ලැබීම සඳහා සුදුසුකම් ලබයි. එවැනි අයදුම්කරුවන් වෙනුවෙන් ශිෂ්‍යාධාර ලබා ගැනීම සඳහා නියමිත අයදුම්පත් (බී ආකෘතිය) කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

04. දිස්ත්‍රික්කයේ අවම කඩඉම් ලකුණු සීමාව හෝ ඊට වැඩි ලකුණු ලබා ඇති **"QUALIFIED"** යනුවෙන් සඳහන් අයදුම්කරුවන්, ජනප්‍රිය පාසල් ලබා ගැනීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන උපදෙස් අනුව අයදුම් කළ යුතුය.

05. **අමප/19/2354/127/064 දරණ 2019.09.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් සඳහා ශිෂ්‍යත්ව 250ක් වෙන් කර ඇති** අතර එම අයදුම්කරුවන් තෝරා ගැනීමේදී පහත දැක්වෙන ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.

i. විශේෂ අවශ්‍යතා සහිත වුවද අඩු ආදායම් අයදුම්කරුවන්ට දිස්ත්‍රික් අවම කඩඉම් ලකුණු සීමාව හෝ ඊට ඉහළ ලකුණු ලබා ඇත්නම් සාමාන්‍ය ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර ලැබීමට හා ජනප්‍රිය පාසලක් අයදුම්කිරීමට හිමිකම් ලැබේ.

ii. දිස්ත්‍රික් අවම කඩඉම් ලකුණු සීමාවට වඩා අඩු වුවද, විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්ගේ නමට ඉදිරියෙන් **"QUALIFIED - SPECIAL NEEDS"** යනුවෙන් සඳහන් වේ නම් ආදායම් තත්ත්වය නොසලකා ඔවුන්ට ශිෂ්‍යාධාර හිමිකම් ලැබේ.

iii. එහෙත් ජනප්‍රිය පාසල් සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත්තේ අදාළ දිස්ත්‍රික් අවම ලකුණු සීමාව හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණි.

මෙම විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර අවස්ථා කිහිපයකදී ම සියුම් පරීක්ෂා කිරීම් රාශියක් සිදු කර ප්‍රතිඵලවල නිරවද්‍යතාව තහවුරු කර ඇත. එසේ වුව ද **යම් අයදුම්කරුවෙකුගේ ප්‍රතිඵලය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සඳහා මාර්ගගතව අභියාචනා ඉදිරිපත් කළ යුතු දිනයන් පිළිබඳව, ඉදිරි දිනකදී දැනුම් දෙනු ලබන අතර, ඒ සඳහා පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරන්න.**

1. https://onlineexams.gov.lk./eic හි School Account Login හරහා ප්‍රවේශ වන්න.
2. පාසල වෙත ලබා දී ඇති පරිශීලක නාම (User name) හා මුරපදය (Password) භාවිත කරමින් School Account වෙත පිවිසෙන්න.
3. අභියාචනාවන්ට අදාළ විභාග අංක ඉදිරියේ දිස්වන "Apply" මත "Click" කරන්න.
4. අභියාචනා අයදුම්කරන ලද සියලු අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් සාරාංශ වාර්තාව බාගත (Download) කරන්න.
5. එහි දෘඪ පිටපත (Hard Copy) සමඟ එක් එක් සිසුවාට අදාළ පහත සඳහන් ලේඛන අමුණා "විභාග කොමසාරිස්, ඇගයීම් (පාසල් විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට විදුහල්පති විසින් ඉදිරිපත් කරන්න.
   - ➢ එක් එක් අයදුම්කරුවන්ගේ සාධනය පිළිබඳව වෙන වෙනම සකස් කළ පන්ති භාර ගුරුවරයාගේ නිර්දේශය
   - ➢ එක් එක් අයදුම්කරු පෙන්වා ඇති විශේෂ දක්ෂතා හා කුසලතා පිළිබඳව වෙන වෙනම සඳහන් කළ වාර්තාව

## 06. දිස්ත්‍රික් කඩඉම් ලකුණු සීමාව

| කඩඉම් ලකුණු | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| 01. | කොළඹ | 139 | 135 |
| 02. | ගම්පහ | 139 | 135 |
| 03. | කළුතර | 139 | 135 |
| 04. | මහනුවර | 139 | 135 |
| 05. | මාතලේ | 139 | 135 |
| 06. | නුවරඑළිය | 133 | 132 |
| 07. | ගාල්ල | 139 | 135 |
| 08. | මාතර | 139 | 135 |
| 09. | හම්බන්තොට | 135 | 133 |
| 10. | යාපනය | - | 133 |
| 11. | කිලිනොච්චි | - | 133 |
| 12. | මන්නාරම | 125 | 131 |
| 13. | වව්නියාව | 125 | 132 |

| කඩඉම් ලකුණු | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| 14. | මුලතිව් | 125 | 132 |
| 15. | මඩකලපුව | 125 | 132 |
| 16. | අම්පාර | 133 | 133 |
| 17. | ත්‍රිකුණාමලය | 133 | 131 |
| 18. | කුරුණෑගල | 139 | 135 |
| 19. | පුත්තලම | 133 | 131 |
| 20. | අනුරාධපුරය | 133 | 130 |
| 21. | පොළොන්නරුව | 133 | 130 |
| 22. | බදුල්ල | 134 | 133 |
| 23. | මොණරාගල | 134 | 133 |
| 24. | රත්නපුර | 135 | 133 |
| 25. | කෑගල්ල | 139 | 135 |

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

පිටපත් ඃ-

01. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. දැ.පි.
02. අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් කටයුතු ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා
03. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු. දැ.පි.
04. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු. දැ.පි.